# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2336/71 - 2023 ජුනි මස 16 වැනි සිකුරාදා - 2023.06.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියමය

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙම උපලේඛනයේ සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ දක්වා ඇති භාණ්ඩ සඳහා 2023.03.28 දිනැති අංක 2325/06 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* උපලේඛනයේ IV වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති සෙස් බදු අනුප්‍රමාණ, මෙම නියමය මගින් 2023 ජුනි මස 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2023 ජුනි මස 16 වැනි දින,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| *සං. ශීර්ෂ අංකය (I)* | *සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය (II)* | | *විස්තරය (III)* | *සෙස් බදු ප්‍රමාණය (IV)* |
|---|---|---|---|---|
| | | | | |
| **25.23** | | | **වර්ණ ගැන්වූ හෝ නොගැන්වූ කැට වශයෙන් වූ හෝ එසේ නොවූ පෝට්ලන්ඩ් සිමෙන්ති, ඇලුමිනියම් මිශ්‍රිත සිමෙන්ති (සිමෙන්ති පොණ්ඩු), යබොර සිමෙන්ති, සුපර් සල්ෆේට් සිමෙන්ති සහ එවැනි හයිඩ්‍රොලික් සිමෙන්ති වර්ග** | |
| | | | | |
| | 2523.10 | - | සිමෙන්ති කැට (ක්ලින්කර්) | කි. ග්‍රෑමයට රු. 1.00 |
| | | - | පෝට්ලන්ඩ් සිමෙන්ති : | |
| | 2523.21 | -- | කෘත්‍රිම ලෙස වර්ණ ගැන්වූ හෝ නොගැන්වූ සුදු සිමෙන්ති | කි. ග්‍රෑමයට රු. 5.00 |
| | 2523.29 | -- | අනෙකුත්: | |
| | 2523.29.10 | --- | දිය නාල්ලන සිමෙන්ති, බොයිලර් සිමෙන්ති සහ ඒවායේ සංයුතික | කි. ග්‍රෑමයට රු. 5.00 |
| | 2523.29.20 | --- | කි. ග්‍රෑම් 50 සහ ඊට අඩු ඇසුරුම්වලින් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | කි. ග්‍රෑමයට රු. 8.00 |
| | 2523.29.30 | --- | කි. ග්‍රෑම් 50 සහ වැඩි ඇසුරුම්වලින් හෝ තොග වශයෙන් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | කි. ග්‍රෑමයට රු. 5.00 |
| | 2523.90 | - | අනෙකුත් හයිඩ්‍රොලික් සිමෙන්ති | කි. ග්‍රෑමයට රු. 5.00 |

EOG 06 - 0147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.